## සිංහල -8 ශ්‍රේණිය

# උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය

- වාක්‍යය නිර්මාණය කිරීමේදී උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි ව තිබිය යුතුය.

## වචන භේදය

සිංහල භාෂාවේ වචන භේදයක් ඇත.එනම් ඒකවචන සහ බහුවචන ලෙසිනි.

| **ඒකවචන** | **බහුවචන** |
|---|---|
| ළමයා | ළමයි |
| මිනිසා | මිනිස්සු |
| ගොවියා | ගොවියා |
| කාන්තාව | කාන්තාවෝ |
| කුරුල්ලා | කුරුල්ලෝ |
| සිංහයා | සිංහයෝ |
| ගවයා | ගවයෝ |
| පොත | පොත් |
| මල | මල් |
| පාසල | පාසල් |

**උක්තය ඒකවචන නම් ආඛ්‍යාතය ඒකවචන විය යුතුය.**

**උක්තය බහුවචන නම් ආඛ්‍යාතය බහුවචන විය යුතුය.**

උදා: <u>ළමයා</u> පොත <u>කියවයි</u>.

මෙම වාක්‍යයේ ‘ළමයා ‘ යන පදය ඒකවචන වේ.ඒ නිසා ක්‍රියා පදය ‘කියවයි ‘ ලෙස යෙදේ.

උදා:<u>ළමයි</u> පොත් <u>කියවති</u>.

මෙම වාක්‍යයේ ‘ළමයි ‘ යන පදය බහුවචන වේ.ඒ නිසා ක්‍රියාපදය ‘කියවති’ ලෙස යෙදේ.

## ලිංග භේදය

සිංහල භාෂාවේ ලිංග භේදයක් ඇත. එනම්

- ස්ත්‍රී ලිංග නාම පද
- පුරුෂ ලිංග නාම පද
- නපුංසක ලිංග නාම පද

**ස්ත්‍රී ලිංග නාම පද**

ස්ත්‍රීවාචී බවක් හඟවන නාම පද වේ.

උදා:දැරිය , අම්මා , ගෙවිලිය ,

ගුරුවරිය , නයනා ,වෛද්‍යවරිය

**පුරුෂ ලිංග නාම පද**

පුරුෂවාචී බවක් හඟවන නාම පද පුරුෂ ලිංග නාම පද වේ.

උදා:දරුවා , තාත්තා , ගොවියා ,

ගුරුවරයා , අමර , වෛද්‍යවරයා

**නපුංසක ලිංග නාම පද**

අප්‍රාණවාචී බවක් හඟවන නාම පද නපුංසක ලිංග නාම පද වේ.

උදා:පොත , පැන්සල , කෝච්චිය , සීනුව

මේසය , රැස්වීම

**ඉහත සටහන් ලිවීමෙන් පසු පහත අභ්‍යාස කරන්න.**

**වර්තමාන කාල ක්‍රියා පද යොදන්න.**

උදා: ළමයා අඹ කයි.

ළමයි අඹ කති.

1. ගොවියා කුඹුරු............................
2. ගොවියෝ කුඹුරු..........................
3. නිමල් පොත .................................
4. නිමල් සහ කමල් පොත................
5. මල්ලී සරුංගලයක්......................
6. මල්ලිලා සරුංගලයක්.................
7. ගුරුවරයා අභ්‍යාස........................
8. ගුරුවරු අභ්‍යාස...........................
9. මිනිසා පාරේ..................................
10. මිනිස්සු පාරේ..............................

**අතීත කාල ක්‍රියා පද යොදන්න**.

උදා: දැරිය ගීයක් ගැයුවා ය.

දරුවා ගීයක් ගැයුවේ ය.

දැරියෝ ගීයක් ගැයුවෝ ය./ ගැයූහ.

දරුවෝ ගීයක් ගැයුවෝ ය./ ගැයූහ.

1. ගැහැණිය දර ...............................
2. ගැහැණු දර...................................

3. පුතා පාඩම්....................................
4. පුත්තු පාඩම්.................................
5. බල්ලා වකුටු වී..............................
6. බල්ලෝ වකුටු වී...........................
7. දර කපන්නා දර.............................
8. දර කපන්නෝ දර...........................
9. අම්මා අපට අවවාද.......................
10. අම්මා අපට අවවාද.....................

**ඔබේ සිංහල පෙළ පොතේ 106 ,109 සහ 110 පිටුවල ඇති ලිඛිත අභ්‍යාස කරන්න.**

ජී.එල්. වත්සලා

ර/ නිවි/ සුමන ම.ම.වි.